# අක්‍රමවත් ඉඩම් පරිහරණ කටයුතු හේතුවෙන් උද්ගතවී ඇති පාරිසරික හා සමාජ ආර්ථික ගැටලු විසඳීමට නව උපායමාර්ගික ප්‍රවේශයක්

ජල හිගය, නියගය, ගංවතුර, වනසත්ව හානි, අලිමිනිස් ගැටුම් ආදිය අද විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටළුවේ. අතීතයේ අඩු ජනගහනයක් සිටීමත් ජනතාවගේ ස්වභාවික පරිසරය හා බැඳුනු සරල ජීවන රටාවත් පරිසර ගැටලු අවම වීමට හේතු විය. අප රට ස්වභාවික සම්පත් සංරක්ෂණය ඈත අතීතයේ රජ්‍ය පාලන යුගය දක්වා දිවයයි. මෙයට වසර 1200කට පමණ රාජ්‍ය පාලනය කල දෙවනපෑතිස් රජතුමාගේ අවදියේ ද ගස්වැල් සිටුවීමට හා ආරක්ෂා කිරීමට නීති අනපනත් පනවා තිබූ බව ඉතිහාසයේ සඳහන් වේ. ජලපෝෂක ප්‍රදේශ හා සමහර කැලෑ ප්‍රදේශ තහනම් කැලෑ ලෙස සංරක්ෂණය සඳහා වෙන්කර තිබූ අතර වන උද්‍යාන හා පළතුරු උයන් ස්තාපනය කිරීමට පියවර ගත් බවද ඉතිහාසයේ සඳහන්වේ. මිහින්තලය ප්‍රදේශයේ ස්ථාපිත එවැනි පළතුරු උද්‍යානයක් අදත් දක්නට ලැබේ.

අතීතයේ වියලි කලාපයේ විසූ වැසියන් වාරි කර්මාන්තය ආශ්‍රිත කෘෂිකර්මයට ප්‍රධාන තැනක් දුන් අතර, ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමටද විශේෂ අවධානය යොමුකරන ලදී. එහිදී බුදුදහමටද විශෙෂ ස්ථානයක්ද ලබා දෙන ලදී. **"වැවයි, දාගැබයි,කෙතයි"** සංකල්පය මේ අනුව බිහිවූවකි. එමගින් ජලාධාර ප්‍රදේශ, කෘෂිකාර්මික බිම්, ජනාවාස හා ආගමික සිද්ධස්ථාන ආදිය සඳහා ප්‍රදේශ වෙන්කර ගනිමින් විශේෂ අවධානයකින් කටයුතු කරනලදී. මෙය අතීතයේ සැලසුම් සහගත ඉඩම් පරිහරණ රටාවක් තිබූ බවට කදීම නිදසුනකි. නමුත් අද මෙම ක්‍රියාදාමය වෙනස්වී ඇත. ඝනවනාන්තර විවිධ අවශ්‍යතාවයන් සඳහා එළිකරනු ලබයි. වනරක්ෂිත තුලින් අක්‍රමවත්ව මාර්ග ඉදිවී ඇත. වැව් රක්ෂිත වල හෝටල් ඉදිවී ඇත. වනාන්තර එළිකර ගම්මාන, සංවර්ධනයෝජනා ක්‍රම ස්ථාපිත කර ඇත. ජලපෝෂක ප්‍රදේශ එළිකර එළවලු ආදිය වගාකර ඇත. කදුමුදුන් හා බෑවුම් වල විවිධ වගාවන්ය හා ඉදිකිරීම්ය. අද මෙම අක්‍රමවත් ඉඩම් පරිහරණ රටාවන් හේතුවෙන් එම ප්‍රදේශ වල වෙසෙන ජනතාව ගැටලු රාශියකට මුහුණ දී ඇත. කලින් සඳහන්කළ පරිදි ගංවතුර, නායයෑම්, පසනිසරුවීම, ජලඋල්පත් සිඳීයාම, වනසත්ව හානි හා අලිමිනිස් ගැටුම් ආදිය මේවා අතර ප්‍රධාන වේ. මේ නිසා මෙම පාරිසරික ගැටලු හැරුණුවිට ඔවුන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු ඇස්තමේන්තු කල නොහැකි තරම්ය. තවද පරිසර දූෂණය, වායු ගෝලීය උෂ්ණත්වය ඉහළයාම හා ඒම හේතුව නිසා උද්ගතව ඇති කාලගුණ වෙනස්වීමට මුළු ජගත් ප්‍රජාවම මුහුණ දීමට සිදුව ඇති අතර එහි ප්‍රතිවිපාක අනාගතයේදී තවත් උග්‍රවනු ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ කිසිදු විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලැස්මක් නොමැතිව පාරිසරික සංවේදී ඉඩම් විවිධ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමයි.

මෑතකදී ලෝක සංරක්ෂක සංගමය (IUCN) මගින් ලෝකයේ විවිධ රටවල කරන ලද අධ්‍යයනයකින් හෙළි වී ඇත්තේ මේවනවිට හෙක්ටයාර් බිලියන දෙකක (2) පමණ භූමි ප්‍රමාණයක් වනාන්තර එළි කිරීම හා වෙනත් හේතූන් නිසා හායනය වී ඇති බවයි. මෙම බිම් ප්‍රමාණය ප්‍රතිස්ථාපනය කිරීමෙන් කාබන්ඩයොක්සයිඩ් ගිගා ටොන් (GT) 15.1 ස්විකරණය (Sequestration) කල හැකි බවට ඇස්තමේන්තුකර ඇත. ඒ මගින් ඇති වන ආර්ථික ප්‍රතිලාභය ඇමෙරිකානු ඩොලර් මිලියන 595ක් පමණ වේ. මේ අනුව මුඩුබිම්වල වන වගා කිරීමෙන් හෝ ගස් සිටුවීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභය කොතෙක් දැයි ගණනය කල හැක.

අද අප මුහුණ දී ඇති ගංවතුර, නායයෑම්, අලි-මිනිස් ගැටුම්, පසෙහි නිෂ්පාදන හැකියාව පහත වැටීම, කාලගුණ විපර්යාස, මැසි මදුරු ව්‍යසන, පරිසර දූෂණය, සමහර ප්‍රදේශවල දැඩි ජනගහණ වර්ධනය හා මාර්ග තදබදය ආදී සියලු තත්වයන් ඇතිවීමට මූලික ව හේතු වී ඇත්තේ සුදුසු විද්‍යාත්මක ඉඩම්

පරිහරණ සැලසුම් නොමැතිව හා අවිධිමත්ව අපගේ ඉඩම් විවිධ කාර්යයන් සඳහා යොදාගැනීමයි. එබැවින් වර්තමානයේ අයහපත් ඉඩම්පරිහරණ ක්‍රම නිසා උද්ගතවී ඇති පාරිසරික හා සමාජ ආර්ථික ගැටලු විසදීමට නව ප්‍රවේශයකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව දැඩි ලෙස පෙනීගොස් ඇත. මේ සඳහා ලෝකයේ අනෙකුත් රටවල් විසින්ද අනුගමනයකරනු ලබන එක් ක්‍රියාමාර්ගයක්වී ඇත්තේ "**භූ-දර්ශන" (Landscape)** පදනම් කරගෙන ඒකාබද්ධ සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීම යි .

මෙහිදී **භූ-දර්ශනයක්** යනු කුමක්දැයි වැටහා ගැනීම අත්‍යවශ්‍යය. එනම් **ජීවීන්, ගස්වැල් හා ඔවුන්ගේ අන්තර් ක්‍රියා සිදුවන ජීවී හා අජීවී සාධක හා ස්වාභාවික සම්පත් ද (වාතය, ජලය හා පස) ඇතුළත් සමස්ත ප්‍රදේශය වේ,"**

භූ-දර්ශන ප්‍රදේශයක්, කඳු මුදුන්වලින් සීමා වූ ජලාධාර ප්‍රදේශයක්, මහාමාර්ග සහ පරිපාලන මායිම් වලින් වෙන්වූ ප්‍රදේශයක්, එසේ නොමැතිනම් දිස්ත්‍රික් මායිම් හා ගංගා සැලකිල්ලට ගනිමින් වෙන්කරගත් ප්‍රදේශයක් ලෙස හෝ ඉහත සඳහන් සියලුම ක්‍රමවේදයන් ඒකාබද්ධව යොදා ගෙන මායිම් සලකුණු කර ගත හැකිය.

මේ අනුව **පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය** මගින් නියමු මට්ටමින් (Pilot Scale), කළමනාකරණ අරමුණු මත අපදනම්ව ප්‍රථම සැලසුම් කරන කාර්ය්‍ය සඳහා "**හුරුළු-කව්ඩුල්ල-කන්තලේ** "භූ-දර්ශන ප්‍රදේශය තෝරාගෙන ඇත. මෙය පහල මහවැලි ජල පෝෂක ප්‍රදේශයට අයත් වන අතර වියලි කලාපයේ අනුරාධපුර, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වැඩි ප්‍රදේශයක් ආවරණය වනපරිදි සීමාවන් හඳුනාගෙන ඇත. තවද, වන රක්ෂිත හා වනජීවී රක්ෂිත හා පරිසර විද්‍යාත්මකව වැදගත් ප්‍රදේශ, වෙරළබඩ ප්‍රදේශ, ජනාවාස, නගර හා වැව් හා ජලමාර්ග හා කෘෂිකාර්මික ප්‍රදේශ ආදියද මෙම භූ-දර්ශන කලාපය තුල පිහිට ඇත.

භූ-දර්ශන කළමනාකරණ සැලැස්මක් සැකසීමේ අරමුණ වන්නේ පාරිසරිකව හායනය වූ ප්‍රදේශ, රකෂිත ප්‍රදේශ හා මිනිස් ජනාවාස ඇතුලත් සමස්ත ප්‍රදේශයම සඳහා විද්‍යාත්මක හා සමාජ ආර්ථික කරුණු පදනම් කරගෙන සැලැස්මක් සකස් කර, එම ප්‍රදේශ කළමනාකරණය සඳහා අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. භූ-දර්ශන ප්‍රදේශයේ ක්‍රියාත්මකවන සියලු ආයතන එකතුවී සහාගිත්ව ප්‍රවේශයකින් ඒකාබද්ධ සැලැස්මක් සකස්කර ක්‍රියාවට නැංවීමෙන් වඩා සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිය. මෙහිදී දිගුකාලීනව, සමෘද්ධිමත් අනාගතයක් ඉලක්ක කරගත් තිරසාර සංරක්ෂණ පිළිවෙතක් අනුගමනය කිරීමට අපේක්ෂා කෙරෙයි.

මෙහිදී ප්‍රධාන වශයෙන් සංරක්ෂණ සංකල්පය සහ පරිසර පද්ධති විධිමත්ව කළමනාකරණය කිරීමේ සංකල්ප මෙම භූ-දර්ශන කළමනාකරණ උපායමාර්ග වලට අනුගත කිරීම අපගේ ව්‍යාපෘතියේ මුලික අරමුණක්වේ.

මෙම නව සැලසුම් ක්‍රියා පිළිවෙතෙහි මුලික ප්‍රතිලාභ වන්නේ; මිනිස් සම්පත්, මූල්‍ය සම්පත් හා අනෙකුත් සියලු භෞතික සම්පත් වඩා තිරසාර ලෙස යොදාගැනීමට හැකිවීම හා භාවිතා කිරීම මගින් එම සම්පත් අපතේ යාම වැලැක්වීම, පරිසර හානි අවම කරගත හැකි වීම, විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ අදාළ සියලුම ආයතනවල විශේෂඥ දැනුම උපයෝගී කරගෙන එම වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි වීම හා ආයතන අතර මනා සම්බන්ධතාවයක් ඇති වීමයි.

මෙම කාර්යයේදී ප්‍රමුඛත්වය ගන්නා ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, භෞතික සම්පත් සැලසුම් දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, කෘෂිකර්ම

දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සම්පාදන දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් සභා (උතුරු මැද/නැගෙනහිර), දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශිය ලේකම්වරු, විශාල වශයෙන් ඉඩම් භාවිතා කරනු ලබන පෞද්ගලික අංශය (සංචාරක හෝටල් ), ස්වේඡා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ආදිය වේ. ප්‍රථමයෙන්, ඉහත ආයතනවලින් නම්කරනු ලබන නිලධාරීන් ඇතුළත් ජාතික හා කලාපීය වශයෙන් කමිටු දෙකක් ස්ථාපිත කර ඇති අතර එමගින් මෙම ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක කරණු ලබන හා යෝජිත වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු එක්රැස් කරනු ලැබේ. මෙහිදී විශේෂයෙන්ම, මෙම කලාපය තුල ඇති අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇති හෝ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මුඩුබිම්ලෙස ඇති සියලු ඉඩම් පිළිබඳ විස්තරද රැස් කිරීමට බලාපොරොත්තු වේ. මෙහිදී රාජ්‍ය ආයතන මෙන්ම ග්‍රාමීය ජනතාව, ග්‍රාමීය සංවිධාන හා ස්වේඡා සංවිධාන ක්ෂේත්‍ර මට්ටමේ දී හමු වී ඔවුන් විසින් පාරම්පරිකව සිදු කරනු ලබන සම්පත් භාවිතය සහ පාරිසරික හා ඒ හා බැඳුණු ඔවුන්ගේ සමාජ, ආර්ථික ගැටලු (උදා: වනාන්තරවලට ඇති තර්ජන, අලි-මිනිස් ගැටුම්, කැලිකසල, කැලෑගිනි, පාංශු ඛාදනය, හා ඉඩම් ලවනීකරණය හා ජල ගැලීම් ආදිය) පිළිබඳව තොරතුරු ද එක්රැස් කිරීම සිදු කෙරේ. සාකච්ඡා, රැස්වීම්, වැඩමුළු, ක්ෂේත්‍ර අධ්‍යයනයන් සහ ග්‍රාමීය සහභාගීත්ව ඇගයීම් (Participatory Rural Appraisal) ආදි ක්‍රමවේදයන් මගින් දත්ත හා තොරතුරු රැස් කෙරේ.

මෙම සැලසුම්කරණ ක්‍රියාදාමය, අරමුණු තීරණය කිරීම, ක්‍රියාකාරී කණ්ඩායම්වලට බෙදීම, කාර්යයභාරය තීරණය කිරීම, ගැටලු හදුනාගැනීම හා විසඳුම් සෙවීම, සුදුසු සංරක්ෂණ ක්‍රියාමාර්ග හඳුනාගැනීම, වැඩසටහන් සැකසීම හා ප්‍රතිපත්ති සහ පාලන ක්‍රමවේදයන් සැකසීම ආදී පියවර යන්ගෙන් සමන්විතවේ.

අවසාන භූ-දර්ශන කළමනාකරණ සැලැස්මට වනවගා කලයුතු හෝ ජෛව වැස්මක් ස්ථාපිත කළ යුතු ප්‍රදේශ, සංරක්ෂණය කලයුතු ප්‍රදේශ, අධි පාරිසරික සංවේදී ප්‍රදේශ, පුරාවිද්‍යා හා සංස්කෘතික වටිනාකමක් ඇති ප්‍රදේශ, අලිමංකඩ හා යෝජිත ඉඩම් පරිහරණ නිර්දේශ ආදියද ඇතුලත් වනු ඇත. එමෙන්ම රක්ෂිත ප්‍රදේශවලින් පරිබාහිරව පිහිටි ගම්මාන, ගෙවතු, කෘෂිකාර්මික ඉඩම් හා වෙනත් පෞද්ගලික ඉඩම් හා රජයේ ඉඩම් සඳහා සුදුසු සංරක්ෂණ සැලසුම් ආදිය ද ඇතුළත් වනු ඇත.

මේ හැරුණුවිට නාගරික සංවර්ධනය, මිනිස් ජනපද සඳහා සුදුසු ප්‍රදේශ හා සංවර්ධන කටයුතු සඳහා සුදුසු ප්‍රදේශ ආදිය ද මෙයට ඇතුලත් වේ. රක්ෂිත ප්‍රදේශ මත යැපෙන අඩු ආදායම්ලාභී පවුල් වල ආර්ථික තත්වය ඉහල නංවාලීම සඳහා සඳහා සුදුසු විකල්ප ආදායම් මාර්ග නිර්දේශ කිරීම හා හඳුන්වා දීම ද මෙම සැලසුම් මගින් සිදු කෙරේ.

යෝජිත සැලැස්ම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගේ එකඟත්වය ලබා ගැනීමෙන් පසු රජයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කරනු ලබන අතර ඉන්පසු දිගුකාලීන මූලික සැලැස්මක් ලෙස සියලුම ඉඩම් භාවිතා කරනුලබන ආයතනවල අහභාගිත්වය ඇතුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි.